ජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 316

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 7.

1985 නොවැම්බර් මස 29 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

කාර්යක්ෂමතා කඩඉම් සහ 1980 ජූලි 17 සිට 22 දින
දක්වා කාලය තුළ සේවය හැර නොගිය රජයේ නිලධාරීන්ට
1981.7.18 දින සිට ගෙවනු ලබන විශේෂ වැටුප් වර්ධකය

ඉහත සඳහන් විශේෂ වැටුප් වර්ධකය ගෙවනු ලැබූ ඇතැම් රජයේ නිලධාරීහු ඔවුන් විසින් කාර්යක්ෂමතා කඩඉමට ළඟාවීම සඳහා ගනු ලබන සාමාන්‍ය කාලයට වඩා වර්ෂයකට කලින් අදාල වැටුප් තලයට එළඹී ඇත.

එබඳු නිලධාරියෙකුට කාර්යක්ෂමතා කඩඉමෙන් උසස්වීමට/නිදහස් වීමට සුදුසුකම් ලැබීම සඳහා, විශේෂ වැටුප් වර්ධකය ගෙවනු ලැබීම නිසා එළඹෙන වැටුප් තලය නොසලකා, සාමාන්‍යයෙන් ලබාගත හැකි සම්පූර්ණ කාලය ලබා දිය යුතුය.

Siriwardhana
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.